ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2002 අංක 16 දරන හර බදු පනත

---

[සහතිකය සටහන් කළේ 2002 අගෝස්තු මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 අගෝස්තු මස 23 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 16.25 යි.** තැපැල් ගාස්තුව : රු. 6.75 යි.

## 2002 අංක 16 දරන හර බදු පනත

[සහතිකය සටහන් කළේ 2002 අගෝස්තු මස 19 වන දින]

එල්. ඩී.–ඕ. 22/2002.

**වාණිජ බැංකුවල ඇතැම් ගිණුම්වලින් හර කිරීම් මත සහ තැන්පතු සහතික හා සංචාරක චෙක්පත් මුදල් කිරීමේ දී ලැබෙන මුදල් මත බදු පැනවීම ද සහ ඒ හා සම්බන්ධ හා ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1.** මේ පනත 2002 අංක 16 දරන හර බදු පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** හර බදු යනුවෙන් හැඳින්වෙන බද්දක්, 13 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව– — හර බදු අය කිරීම.

(අ) වාණිජ බැංකුවක පවත්වාගෙන යනු ලබන එක් එක් ජංගම ගිණුමකට, එක් එක් ලිත් මාසය තුළ කෙරෙන හර කිරීම්වල එකතුවෙන් ;

(ආ) තැන්පතු සහතිකයක් හෝ සංචාරක චෙක්පතක් මුදල් කිරීමේ දී ලැබෙන මුදලකින්,

අවස්ථාවෝචිත පරිදි එම හර කරනු ලබන මුළු මුදලින් හෝ මුදල් කිරීමේ දී ලැබෙන මුදලින් සියයට එකකින් දහයෙන් එකක අනුප්‍රමාණය අනුව, නියම කර අය කර ගනු ලැබිය යුතු ය.

**3.** 2 වන වගන්තිය යටතේ පනවනු ලබන හර බදු– — බද්දට යටත් වීම.

(අ) වාණිජ බැංකුවක පවත්වාගන යන ජංගම ගිණුමක් සම්බන්ධයෙන් වන විට, ඒ ගිණුම පවත්වාගෙන යන තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නමින් ගෙවනු ලැබිය යුතු ය ;

(ආ) තැන්පතු සහතිකයක් මුදල් කිරීමෙන් උපලබ්ධ වන මුදල් ප්‍රමාණයක් සම්බන්ධයෙන් වන විට, ඒ සහතිකය දරන්නා විසින් ගෙවනු ලැබිය යුතු ය ; සහ

(ඇ) සංචාරක චෙක්පත් මුදල් කිරීමෙන් උපලබ්ධ වන මුදල් ප්‍රමාණයක් සම්බන්ධයෙන් වන විට, එම සංචාරක චෙක්පත මුදල් කිරීම සඳහා ඉදිරිපත් කරන තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු ය.

හර බදු ගෙවීමේ බැඳීම ආරම්භ වන අවස්ථාව.

4. හර බදු ගෙවීමට තැනැත්තකුගේ බැඳීම–

(අ) වාණිජ බැංකුවක පවත්වාගෙන යන ජංගම ගිණුමකින් හර කිරීමක් සම්බන්ධයෙන් වන විට, එම හර කිරීම සිදු කරනු ලැබූ මාසයේ අවසානයේ දී ;

(ආ) තැන්පතු සහතිකයක් හෝ සංචාරක චෙක්පතක් සම්බන්ධයෙන් වන විට, එය මුදල් කරනු ලැබූ විහාම,

ආරම්භ විය යුතු ය.

හර බදු අයකර ප්‍රේෂණය කිරීමට මූල්‍ය ආයතනවල බැඳීම.

5. සෑම වාණිජ බැංකුවක්, විශේෂිත බැංකුවක්, මුදල් සමාගමක් හෝ බලයලත් වෙළෙන්දකුම ජංගම ගිණුම් ගනුදෙනුවලින්, තැන්පතු සහතික මුදල් කිරීමෙන්, සහ සංචාරක චෙක්පත් මුදල් කිරීමෙන් උද්ගතවන හර බදු අයකර මේ පනතේ විධිවිධානවලට අනුකූලව ප්‍රේෂණය කිරීමට බැඳී සිටින්නේ ය.

හර බදු අයකිරීම හා ප්‍රේෂණය කිරීම.

6. (1) සෑම වාණිජ බැංකුවක් විසින් ම, සෑම මාසයක් මුල දී ම, ඒ බැංකුවේ පවත්වාගෙන යන සෑම ජංගම ගිණුමකින් ම, ඊට පූර්ව මාසය සඳහා හර බදු වශයෙන් ඒ ගිණුමෙන් ගෙවිය යුතු මුදලට සමාන මුදලක් අස්කරගෙන ඒ මුදල් ප්‍රමාණය එක් එක් මාසයේ වැඩ කරන අවසන් දින හෝ එදිනට පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු ය :

එසේ වුව ද, යම් මාසයක ආරම්භය වැඩ කරනු නොලබන දිනයකට යෙදුනහොත් එසේ මුදල් අස්කර ගැනීම, ඉන් අනතුරුව එළඹෙන වැඩකරන පළමු දිනයේ දී කරනු ලැබිය හැකි ය :

එසේම තවදුරටත් කිසියම් මාසයක ජංගම ගිණුමක හර බදු බැරකම රුපියල් දහයකට අඩුනම්, ඒ ගිණුමෙන් හර බදු අස්කර නොගත යුතු ය.

(2) තැන්පතු සහතිකයක් හෝ සංචාරක චෙක්පතක් මුදල් කිරීමේ දී, සෑම වාණිජ බැංකුවක්, විශේෂිත බැංකුවක්, මුදල් සමාගමක් හෝ බලයලත් වෙළෙන්දකු විසින්, එම මුදල් කිරීමේ දී

උපලබ්ධවන මුදල් ප්‍රමාණයෙන් ඒ මුදල් ප්‍රමාණය මත ගෙවනු ලැබිය යුතු හර බදු මුදලට සමාන මුදලක් අඩුකරගෙන, එම මුදල, එකී තැන්පතු සහතිකය හෝ සංචාරක චෙක්පත මුදල් කරනු ලැබූ මාසයට පසුව එළඹෙන මාසයේ වැඩ කරන අවසන් දින දී හෝ ඊට ප්‍රථම කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු ය.

(3) හර බදු ගෙවීම වශයෙන් (1) වන උපවගන්තිය යටතේ යම් මුදලක් අස්කරගෙන ප්‍රේෂණය කරනු ලබන හෝ (2) වන උපවගන්තිය යටතේ අඩුකරගෙන ප්‍රේෂණය කරනු ලබන අවස්ථාවක එම ගෙවීම අවස්ථාවෝචිත පරිදි, එම ජංගම ගිණුම වාණිජ බැංකුවෙහි පවත්වාගෙන යනු ලබන්නේ යම් තැනැත්තකුගේ නමින් ද ඒ තැනැත්තාගේ හෝ තැන්පතු සහතිකය දරන තැනැත්තාගේ හෝ සංචාරක චෙක්පත මුදල් කිරීම සඳහා ඉදිරිපත් කරන්නේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තාගේ හෝ අවසරය ඇතිව කරන ගෙවීමක් ලෙස සැලකිය යුතු අතර, එය හර බදු ගෙවීමට ඒ තැනැත්තාගේ බැඳීම, 10 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගු ආකාරයෙන් ඉටු කිරීමක් ලෙස සැලකිය යුතු ය.

(4) ජංගම ගිණුමක් යම් වාණිජ බැංකුවක පවත්වාගෙන යනු ලැබේ ද ඒ වාණිජ බැංකුවට, යම් මාසයකට පෙරාතුව ම වූ මාසයේ දී ඒ ගිණුමෙන් කරන ලද හර කිරීම් මත ගෙවිය යුතු හර බදු සම්පූර්ණයෙන් අය කර ගැනීමට හෝ ඉන් කොටසක් අය කර ගැනීමට ඒ ජංගම ගිණුමේ අරමුදල් නොමැති වීම නිසා හෝ ඒ ජංගම ගිණුමේ ප්‍රමාණවත් අරමුදලක් නොමැතිවීම නිසා හෝ නොහැකි වන අවස්ථාවක, ඒ ගිණුම පවත්වාගන යනු ලබන්නේ යම් තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ නමින් ද ඒ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නම හා ලිපිනය හෝ නම් සහ ලිපින ද එකී පෙරාතුව ම වූ මාසයේ දී ඒ ගිණුමෙන් කරන ලද හර කිරීම්වල එකතුව හා ඒ මුදල් ප්‍රමාණය මත ගෙවිය යුතු හර බදු, ඒ හිඟ තැබීම සිදු වූ එක් එක් මාසයේ වැඩ කරන අවසන් දින හෝ ඊට ප්‍රථම, ඒ බැංකුව විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත වාර්තා කළ යුතු ය :

එසේ වුව ද, එසේ ගෙවිය යුතු හර බදු මාස දෙකක කාලසීමාවක් ඇතුළත අය කර ගැනීමට හැකිනම්, එම වාණිජ බැංකුව විසින් එසේ ඉහත කී පරිදි වාර්තාවක් සැපයීම මාස දෙකක කාලයකට කල් තැබිය හැකි ය.

(5) යම් වාණිජ බැංකුවක පවත්වාගෙන යන ජංගම ගිණුමක් පවත්වාගෙන යනු ලබන්නේ යම් තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ නමින් හෝ නම්වලින් ද ඒ තැනැත්තා හෝ තැනැත්තන් විසින් චෙක්පතක්, අණකරයක්, ඇණවුමක් හෝ වෙනත් යම් උපදේශයක් මගින් ඉල්ලා සිටින යම් මුදලක් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් හෝ ගෙවීම, ඒ ගිණුමෙන් කරන ලද හර කිරීම් සඳහා හර බදු ගෙවීමට තිබීමේ හේතුව මත පමණක් ප්‍රතික්ෂේප කිරීමට, මේ වගන්තියේ මීට ඉහතින් වූ විධිවිධානවල අන්තර්ගත කිසිවකින් වාණිජ බැංකුවකට බලය පැවරෙන්නේ යයි නොසැලකිය යුතු ය :

එසේ වුව ද, ඒ චෙක්පතක්, අණකරයක්, ඇණවුමක් හෝ වෙනත් උපදේශයක් ප්‍රකාර ගෙවීම් කිරීමට ප්‍රථම, කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතුව තිබෙන හර බද්දක මුදල අයකර ගනු ලැබිය හැකි ය.

බැංකුවේ බැඳීම අවසන් වීම.

7. මේ පනතට අනුකූලව යම් ජංගම ගිණුම් හිමියකු විසින් ගෙවනු ලැබිය යුතු හර බදු අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් අරමුදල් සැපයීම අසමත්වන අවස්ථාවක, ඒ කාරණය කොමසාරිස් ජනරාල්වරයා වෙත බැංකුව විසින් වාර්තා කරනු ලැබූ විට, හර බද්ද අයකිරීමට බැංකුව කෙරෙහි ඇති බැඳීම නතර වන්නේ ය.

බදු අවකරණ සහතිකය.

8. (1) මේ පනතට අනුකූලව හර බදු ගෙවන තැනැත්තකුට, ඒ බද්ද අඩුකරගන්නා තැනැත්තාගෙන් "බදු අවකරණ සහතිකයක්" ඉල්ලීමක් කර ලබා ගත හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන" බදු අවකරණ සහතිකයෙහි" ඉල්ලා සිටින සහතිකය අදාල වන කාලය සඳහා–

(අ) ජංගම ගිණුමකින් කරන ලද හර කිරීම්වල මුළු එකතුව හෝ අවස්ථාවෝචිත පරිදි තැන්පතු සහතික හෝ සංචාරක චෙක්පත් හෝ මුදල් කිරීමෙන් ලබාගත් මුළු මුදල් ප්‍රමාණය;

(ආ) හර බදු වශයෙන් අඩුකරගන්නා ලද මුදල් ප්‍රමාණය හා සම්බන්ධ තොරතුරු ඇතුලත් විය යුතු ය.

(3) එම සහතිකයට, එම මුදල් ප්‍රමාණය කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කිරීම පිළිබඳ තහවුරුවක් ඇතුළත් විය යුතු ය.

9. (1) වාණිජ බැංකුවක් විසින් 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් මුදල් ප්‍රමාණයන් ප්‍රේෂණය කරන විට දී, විශේෂ ජංගම ගිණුමක් නොවන ජංගම ගිණුමක් සම්බන්ධයෙන්, පහත දැක්වෙන කරුණු ඇතුළත් ප්‍රකාශයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයිය යුතු ය :- වාර වාර්තා.

(අ) ඒ බැංකුවේ පවත්වාගෙන යන සියලු ජංගම ගිණුම්වලින්, පූර්ව මාසයේ දී කරන ලද හර කිරීම්වල මුළු මුදල් ප්‍රමාණය ;

(ආ) ඒ බැංකුවේ පවත්වාගෙන යන සියලු විශේෂ ජංගම ගිණුම්වලින්, පූර්ව මාසයේ දී කරන ලද හර කිරීම්වල මුළු මුදල් ප්‍රමාණය ;

(ඇ) ඒ මාසයේ දී සියලු ජංගම ගිණුම්වලින් හර බදු ලෙස ඉවත් කරගන්නා ලද මුදල් ප්‍රමාණ ;

(ඈ) 12 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (1) අනුඡේදය යටතේ සහ 12 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ආපසු ගෙවන ලද මුදල් ප්‍රමාණ ;

(ඉ) මාසයක් තුළ එක් එක් ජංගම ගිණුමේ නිදහස් කරන ලද මුළු හර කිරීම් ප්‍රමාණය, ඒ අදාළ ජංගම ගිණුමේ සම්පූර්ණ හර කිරීම්වලින් සියයට පණහක් හෝ රුපියල් පණස් දහසක් යන මෙයින් වඩා අඩු මුදල ඉක්මවා යන අවස්ථාවක, 13 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ නිදහස් කරන ලද හර කිරීම් වෙනුවෙන් ආපසු ගෙවීම් ඉල්ලා තිබෙන ගිණුම් හිමියන්ගේ නම් සහ ලිපින.

(2) වාණිජ බැංකුවක්, විශේෂිත බැංකුවක්, මුදල් සමාගමක් හෝ බලයලත් වෙළෙන්දකු විසින්, 6 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් මුදල් ප්‍රමාණයන් ප්‍රේෂණය කරන විට දී–

(අ) අවස්ථාවෝචිත පරිදි තැන්පතු සහතිකය හෝ සංචාරක චෙක්පත මුදල් කිරීමෙන් උපලබ්ධිත මුදල් ප්‍රමාණය;

(ආ) ඒ මුදල මත ගෙවිය යුතු හර බදු ලෙස ඒ මුදලින් අඩුකර ගන්නා ලද මුදල් ප්‍රමාණය,

දැක්වෙන ප්‍රකාශයක්, ඒ ප්‍රේෂණය සමග කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයිය යුතු ය.

හර බදු ගෙවීම පැහැර හැරීම.

10. (1) යම් තැනැත්තකු විසින් වාණිජ බැංකුවක පවත්වාගෙන යන ජංගම ගිණුමකින්, යම් ලිත් මාසයක් තුළ කරන ලද හර කිරීම් මත අයවිය යුතු හර බදු රැස් කර ගැනීමට ඒ බැංකුවට නුපුළුවන් බව 6 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වාණිජ බැංකුවක් වාර්තා කළ අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියවිල්ලක් මගින් බලය පවරන ලද නිලධරයකු විසින්, ලිඛිතව එම ලියවිල්ලේ විධානයෙහි දින සිට දින දහහතරක් ඇතුළත, ඒ හර බදු මුදල ඒකාබද්ධ අරමුදලට බැර කිරීම පිණිස කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවන ලෙස, ඒ තැනැත්තාට විධාන කළ යුතු ය. එකී දින දහහතර ඇතුළත ඒ මුදල කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලැබුවහොත්, ඒ මුදල ගෙවීම පැහැර හරිනු ලැබූ මුදලක් ලෙස සැලකිය යුතු අතර ඒ තැනැත්තා පැහැර හරින්නකු ලෙස සැලකිය යුතු ය.

(2) වාණිජ බැංකුවක්, විශේෂිත බැංකුවක්, මූල්‍ය සමාගමක් හෝ බලයලත් වෙළෙන්දකු විසින් 6 වන වගන්තිය යටතේ–

(අ) ඒ වාණිජ බැංකුවෙහි පවත්වාගෙන යන ජංගම ගිණුමකින් යම් මාසයක දී කරන ලද හර කිරීම්වල මුළු මුදල මත ; හෝ

(ආ) තැන්පතු සහතිකයක් හෝ සංචාරක චෙක්පතක් මුදල් කිරීමෙන් උපලබ්ධ කරගත් මුදල මත,

ගෙවිය යුතු හර බදු, අවස්ථාවෝචිත පරිදි ඒ හර කිරීම්වල මුළු මුදල මත හෝ එසේ උපලබ්ධිත මුදල මත හර බදු වශයෙන් ගෙවනු ලැබිය යුතු නිසි මුදල් ප්‍රමාණයට වඩා අඩු අවස්ථාවක කොමසාරිස් ජනරාල්වරයා විසින්, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ හර බදු වශයෙන් නිසි පරිදි ගෙවිය යුතු මුදල සහ එම හර බදු ලෙස ප්‍රේෂණය කර තිබෙන මුදල අතර වෙනස, ඒකාබද්ධ අරමුදලට බැර කිරීම පිණිස, ඒ දැන්වීමේ දින සිට දින දහහතරක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවන ලෙස, ඒ බැංකුවට, මුදල් සමාගමට හෝ වෙළෙන්දාට හෝ හර බදු ගෙවීමට යටත් තැනැත්තාට නියම කළ යුතු ය. එකී දින දහහතර ඇතුළත ඒ වෙනසෙහි මුදල් ප්‍රමාණය ගෙවීම, ඒ බැංකුව, සමාගම, වෙළෙන්දා හෝ තැනැත්තා විසින් පැහැර හරිනු ලැබුවහොත්, ඒ මුදල, ගෙවීම් පැහැර හරිනු ලැබූ මුදලක් ලෙස සැලකිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි ඒ බැංකුව, සමාගම, වෙළෙන්දා හෝ තැනැත්තා, පැහැර හරින්නකු ලෙස සැලකිය යුතු ය.

අයකර ගැනීම.

**11.** යම් හර බඳු හෝ ඉන් යම් කොටසක් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, එසේ ගෙවීම් පැහැර හරිනු ලැබූ මුදල සහ පැහැර හරින්නාගේ නම, අවසන් වරට දන්නා පදිංචි ස්ථාන හෝ ව්‍යාපාරික ස්ථානය, පිළිබඳ විස්තර ඇතුළත් සහතිකයක් ඒ ස්ථානය පිහිටි කොට්ඨාසය කෙරෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය. එවිට මහෙස්ත්‍රාත්වරයා විසින් පැහැර හරින්නාට විරුද්ධව එසේ ගෙවීම් පැහැර හරිනු ලැබූ හර බඳු මුදල අය කර ගැනීම පිණිස නඩු කටයුතු කර ගෙන නොයා යුත්තේ මන්ද යන වගට හේතු දක්වන ලෙස පැහැර හරින්නා කැඳවිය යුතු අතර, ප්‍රමාණවත් හේතු දැක්වීමක් කරනු නොලැබුවහොත්, එම ගෙවීම් පැහැර හැරි හර බඳු මුදල, ඒ පැහැර හරින්නාට මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දඩයක් වූවක් සේ මහෙස්ත්‍රාත්වරයාගේ ආඥාවක් මගින් අය කරනු ලැබිය යුතු ය. එය එසේ අය කර ගනු ලැබූ විට, ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

ආපසු ගෙවීම.

**12.** (1) ගෙවීමට යටත් ප්‍රමාණය ඉක්මවා කරනු ලැබූ බදු ගෙවීම් හෝ නිදහස් කරන ලද ගිණුම් මත කරන ලද බදු ගෙවීම් එසේ අඩුකර ගන්නා ලද්දේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තාට, එසේ අඩුකර ගන්නා ලද හර බදු ගෙවීම් පහත දැක්වෙන පරිදි ආපසු ගෙවනු ලැබිය හැකි ය ;

(i) හර බදු ගෙවීම් කොමසාරිස් ජනරාල්වරයාට ප්‍රේෂණය කිරීමට ප්‍රථම, ගිණුම් හිමියා විසින් ආපසු ගෙවීමක් ඉල්ලා සිටින ලද අවස්ථාවක, එසේ වැඩිපුර අඩුකරගෙන තිබෙන හර බදු වාණිජ බැංකුව, විශේෂිත බැංකුව, මුදල් සමාගම හෝ බලයලත් වෙළෙන්දා විසින් ආපසු ගෙවනු ලැබිය හැකි ය

(ii) කොමසාරිස් ජනරාල්වරයා වෙත හර බදු ගෙවීම් ප්‍රේෂණය කරනු ලැබීමෙන් පසුව ගිණුම් හිමියකු විසින් ආපසු ගෙවීමක් ඉල්ලා සිටිනු ලැබූ අවස්ථාවක, එම බදු එසේ අඩුකර ගන්නා ලද්දේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා විසින් එම ගෙවීමේ දින සිට මාස දොළහක් ඇතුළත ලියවිල්ලක් මගින් කොමසාරිස් ජනරාල්වරයා වෙත කරන හිමිකම් පෑමක් මත, එසේ ගෙවා තිබෙන හර බදු මුදල් කොමසාරිස් ජනරාල්වරයා විසින් ආපසු ගෙවනු ලැබිය හැකි ය. එම ආපසු ගෙවීම් කිරීමට ප්‍රථම, කොමසාරිස් ජනරාල්වරයා එම හිමිකම්පෑමෙහි සත්‍යතාව පිළිබඳව සෑහීමට පත්විය යුතු ය.

(2) 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ ප්‍රකාශයක පදනම මත, (1) වන උපවගන්තියේ (1) ඡේදයේ විධිවිධාන යටතේ කරන ආපසු ගෙවීමක දී, නිදහස් කරන ලද හර කිරීම් ලෙස ගිණුම් හිමියා හඳුන්වන හරකිරීම්වල මුදල් ප්‍රමාණයන්, එම ප්‍රකාශය ආමන්ත්‍රිත බැංකුව විසින් බැංකුවේ වාර්තාවලින් සත්‍යායනය කර, එම නිදහස් කළ හරකිරීම් මත වූ හර බද්ද ගිණුම් හිමියාගේ ගිණුමෙන් කලින් අස්කර ගෙන ඇත්නම්, එම හර බද්ද ආපසු ගෙවිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ ආපසු ගෙවීම් වශයෙන් ගෙවිය යුතු සියලු මුදල් අවස්ථාවෝචිත පරිදි අදාළ වාණිජ බැංකුව, විශේෂිත බැංකුව, මුදල් සමාගම හෝ බලයලත් විකුණුම්කරු විසින් ඒ බැංකුවේ, සමාගමේ හෝ විකුණුම්කරුගේ අරමුදලින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒකාබද්ධ අරමුදලින් හෝ ගෙවිය යුතු ය.

නිදහස් කිරීම්.

**13.** (1) පහත සඳහන් හර කිරීම්, හර බදු ගෙවීමෙන් නිදහස් විය යුතු ය :–

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුව, ශ්‍රී ලංකා මහ බැංකුව, යම් පළාත් සභාවක්, යම් පළාත් පාලන ආයතනයක්, යම් විදේශීය ආණ්ඩුවක්, හෝ 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධාන අදාළ වන යම් රජයක දූත මණ්ඩලයක් හෝ යම් සංවිධානයක්, හෝ ඒ දූත මණ්ඩලයක හෝ සංවිධානයක යම් රාජ්‍ය දූත නිලධරයකු හෝ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් අනුමත කරන යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයක් විසින් පවත්වාගෙන යනු ලබන යම් ජංගම ගිණුමකින් කරන හර කිරීම් ;

(ආ) යම් තැනැත්තකු විසින්, හුදෙක් පහත සඳහන් කාර්ය සඳහා, එනම් :–

(i) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත යම් ණයක් ආපසු ගෙවීම හෝ ණයක් සඳහා පොලී ගෙවීම ;

(ii) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත යම් බද්දක් ගෙවීම ;

(iii) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යම් බද්දක්, තීරු බද්දක්, අයකිරීමක් හෝ සෙස් බද්දක් ගෙවීම ;

(iv) සුරාබදු කොමසාරිස්වරයා වෙත හෝ සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත යම් බද්දක් හෝ තීරු බද්දක් ගෙවීම ;

(v) ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි වෙනත් යම් ගෙවීමක්,

සඳහා, එම ගිණුම එම ගෙවීම් කිරීමේ කාර්ය සඳහාම පමණක් බවට ගිණුම් හිමියාගේ ප්‍රකාශයක් සහ පොරොන්දුවක පදනම මත වාණිජ බැංකුවක විවෘත කරන විශේෂ ගිණුමක් මත යම් ජංගම ගිණුමකින් කරන හර කිරීම් ;

(ඇ) ගිණුම තුදෙක් පහත සඳහන් ගෙවීම් කිරීමේ කාර්යය සඳහා බවට ගිණුම් හිමියාගේ ප්‍රකාශයක සහ පොරොන්දුවක පදනම මත සහ මෙහි පහත නිශ්චිතව සඳහන් යම් තැනැත්තකු විසින් වාණිජ බැංකුවක විවෘත කරන යම් විශේෂ ගිණුමක් වන ජංගම ගිණුමකින් පහත සඳහන් ගෙවීම් සඳහා කරන හර කිරීම් :-

(i) සේවක අර්ථ සාධක අරමුදල, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වැනි යම් අරමුදලකින් හෝ යෝජනා ක්‍රමයකින් හෝ සේවක අර්ථ සාධක අරමුදල පනතේ අර්ථානුකූල අනුමත කළ අර්ථසාධක අරමුදලකින් හෝ සේවක දායකත්වය සහිත විශ්‍රාම වැටුප් ක්‍රමයකින් එහි දායකයන් සඳහා ප්‍රතිලාභ වශයෙන් කරන ගෙවීම් හෝ පාරිතෝෂික ගෙවීම් පනතේ අර්ථානුකූලව සේවක දායකත්වය රහිත විශ්‍රාම වැටුප් ක්‍රමයකින් හෝ දායකත්වය සහිත උත්තර ජීවි විශ්‍රාම වැටුප් ක්‍රමයකින් කරන ගෙවීම් ;

(ii) බලපත්‍රලත් නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවකු විසින් ගනුදෙනුකරුවන් සඳහා සහ වෙනුවෙන්, වෙළෙඳ ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා කරන ගෙවීම් සහ එම වෙළෙඳ ද්‍රව්‍ය විකිණීමෙන් ලත් මුදල් ප්‍රේෂණය කිරීම වශයෙන් වන ගෙවීම් ;

(iii) ප්‍රාථමික වෙළෙන්දකු විසින් ආණ්ඩුවේ සුරැකුම්පත් පිළිබඳ ගනුදෙනු හා සම්බන්ධව කරන ගෙවීම් ;

(iv) ප්‍රාථමික වෙළෙන්දකු හෝ වාණිජ බැංකුවක්, මුදල් සමාගමක්, බලපත්‍රලත් මූල්‍ය කල්බදු සමාගමක් හෝ සීමිත වගකීම් සහිත සමාගමක් හෝ පුද්ගලයකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් ද්විතියික වෙළෙඳපලෙහි දී සියලු (ආණ්ඩුවේ සහ සංස්ථාගත) ණය සුරැකුම්පත් මුළුමනින් (විකිණීම් සහ මිල දී ගැනීම් යන දෙකම) සහ ප්‍රතිමිල දී ගැනීම් සහ ප්‍රතිවර්ත්‍ය ප්‍රතිමිල දී ගැනීම හා සම්බන්ධ ගෙවීම් ;

(v) බලපත්‍රලත් ව්‍යාපාරවස්තු තැරැව්කරුවකු විසින් හෝ සීමිත වගකීම් සහිත සමාගමක් විසින් හෝ පුද්ගලයකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින්, ගනුදෙනුකරුවකු වෙනුවෙන් කොළඹ ව්‍යාපාරවස්තු විනිමය ස්ථානයේ දී සිදුකරන ලද ගනුදෙනු බේරුම් කිරීම සම්බන්ධ ගෙවීම් ;

(vi) විදේශයක බැංකු ආයතනයකින් ඒ ගිණුමට මාරුකර එවන ලද අරමුදල් උපයෝජනය කරගෙන, යම් වාසික පුද්ගලයන්ට ගෙවීම් ;

(vii) වාණිජ බැංකුවක්, විශේෂිත බැංකුවක්, බලපත්‍රලත් මූල්‍ය කල්බදු සමාගමක් හෝ කොමසාරිස් ජනරාල්වරයා අනුමත කළ වෙනත් යම් මූල්‍යමය අතරමැදියකු වෙනත් වාණිජ බැංකුවක පවත්වාගෙන යන එවැනි යම් ගිණුමකින් කරන–

(අ) වාණිජ බැංකු සම්බන්ධයෙන් වන විට, බැංකු පනතේ II වන උපලේඛනයේ ගෙන හැර දැක්වෙන, (ච), (ජ), (ත)

සහ (ඞ) යන විෂයයන් නොවන, ඒ උපලේඛනයේ දැක්වෙන ක්‍රියාකාරකම් හා සම්බන්ධ හරකිරීම් සහ ඒ ක්‍රියාකාරකම්වලින් උද්ගත වන, මුල් මුදල සහ පොලිය යන දෙකටම අයත් මූල්‍යමය බැඳීම් බේරුම් කිරීම හා සම්බන්ධ හර කිරීම් වන ගෙවීම් :

එසේ වුවද, බැංකු පනතේ II වන උපලේඛනයේ (ද) විෂයය සම්බන්ධයෙන් වන විට, ප්‍රදානය කරන ලද නිදහස් කිරීම අදාළ විය යුත්තේ වන්ග්‍යෝගක ක්‍රියාකාරකම් හා සම්බන්ධව පමණකි ;

(ආ) විශේෂිත බැංකුවක් සම්බන්ධයෙන් වන විට, බැංකු පනතේ IV වන උපලේඛනයේ දැක්වෙන කටයුතු අතරින් (එඑ), (ඒඒ), (ඕඕ), (කක) සහ (ගග) යන විෂයයන් හැර, ඒ උපලේඛනයේ ගෙන හැර දැක්වෙන ක්‍රියාකාරකම් හා සම්බන්ධ හර කිරීම් සහ ඒ ක්‍රියාකාරකම් වලින් උද්ගතවන, මුල් මුදල හා පොලිය පිළිබඳ වූ මූල්‍යමය බැඳීම් බේරුම් කිරීම සම්බන්ධ හර කිරීම් වන ගෙවීම් ;

(ඇ) බලපත්‍රලත් මූල්‍ය කල්බදු සමාගම් හෝ කොමසාරිස් ජනරාල්වරයා අනුමත කළ වෙනත් යම් මූල්‍ය අතරමැදියන් සම්බන්ධයෙන් වන විට, අතරමැදි කටයුතු හා සම්බන්ධව සහ ඒ කටයුතු වලින් උද්ගත වන පොලිය හා මුල් මුදල පිළිබඳ මූල්‍යමය බැඳීම් බේරුම් කිරීම සම්බන්ධ හර කිරීම් වන ගෙවීම් :

එසේ වුවද මෙහි ඉහත (අ) සහ (ආ) ඡේදවල දැක්වෙන නිදහස් කිරීම්වලින් බැහැර කර තිබෙන, වාණිජ බැංකුවක හෝ විශේෂිත බැංකුවක බලපත්‍රලත් ක්‍රියාකාරකම් සම්බන්ධ හර කිරීම් බලපත්‍රලත් මූල්‍ය කල්බදු සමාගම්

හෝ කොමසාරිස් ජනරාල්වරයා අනුමත කළ වෙනත් යම් මූල්‍ය අතරමැදියකුට ද අදාළ විය යුතු ය. (යම් ක්‍රියාකාරකමක් මේ ඡේදයේ කාර්ය සඳහා මූල්‍යමය මැදිහත් වීමක් වන්නේ ද යන වග නිශ්චය කිරීමේ අවසානාත්මක බලධරයා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විය යුතු ය.) ;

(viii) යම් තැනැත්තකු විසින් යම් වාණිජ බැංකුවක, රැස්කිරීමේ ගිණුමක් වශයෙන්, හුදෙක් අරමුදල් භාර ගැනීමේ සහ ඒ බැංකුවේ වෙනත් ශාඛාවල හෝ ප්‍රධාන කාර්යාලයේ හෝ ඒ තැනැත්තා විසින් පවත්වාගෙන යන ගිණුම්වලට එම අරමුදල් මාරු කර යැවීමේ පහසුකම් සඳහා වූ ගිණුමකින් කරන හර කිරීම් වන්නා වූ ගෙවීම් ;

(ඈ) යම් ගිණුම් හිමියකුගේ යම් ජංගම ගිණුමකින් කරන–

(i) වාණිජ බැංකුවක පවත්වාගෙන යන එවැනි ගිණුමකින්, ඒ බැංකුවේ ම හෝ වෙනත් යම් වාණිජ බැංකුවක හෝ ඒ ගිණුම් හිමියාගේ ම නමින් පවත්වාගෙන යන වෙනත් ජංගම ගිණුමකට අරමුදල් මාරු කිරීම සඳහා හර කිරීම් ;

(ii) ඒ ගිණුමෙන් හර බදු ගෙවීම සඳහා අස්කරගන්නා මුදල් ප්‍රමාණ වෙනුවෙන් ඒ ගිණුමෙන් කරන හර කිරීම් ;

(iii) ගිණුම්හිමියා විසින් අරමුදල් අස්කර ගැනීමක් නොවන, අගරු කළ චෙක්පත් වෙනුවෙන්, දෝෂ නිදොස් කිරීම් වශයෙන් හෝ ප්‍රතිපාක්ෂික සටහන් වෙනුවෙන් හෝ කරන හර කිරීම්

වන්නා වූ ගෙවීම් ;

(ඉ) යම් ජංගම ගිණුමකින්–

(i) වාණිජ බැංකුවක, ශ්‍රී ලංකාවේ ප්‍රධාන කාර්යාලය, ඒ බැංකුවේ ශ්‍රී ලංකාවේ වෙනත් ශාඛාවක පවත්වාගෙන යන ගිණුමකට අදාළව කරන හර කිරීම් ;

(ii) වාණිජ බැංකුවක, ශ්‍රී ලංකාවේ ශාඛාවක් ඒ බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යන ගිණුමකට අදාළව කරන හර කිරීම්;

(iii) වාණිජ බැංකුවක ශ්‍රී ලංකාවේ ශාඛාවක්, ඒ බැංකුවේ වෙනත් ශාඛාවක පවත්වාගෙන යන ගිණුමකට අදාළව කරන හර කිරීම්,

වන්නා වූ ගෙවීම් ;

(ඊ) ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගෙන, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින්, කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ, ජංගම ගිණුම්වලින් කරන වෙනත් යම් ගිණුම් හර කිරීම් හෝ යම් පන්තියකට අයත් හර කිරීම් වන්නා වූ ගෙවීම්.

(2) (ඇ) ඡේදයේ (i), (ii) හා (iii) වන අනුඡේදවල නිශ්චිතව සඳහන් නිදහස් කිරීම් සඳහා සුදුසුකම් ලැබීම පිණිස, මාසයේ පහළොස්වන දින හෝ ඊට පෙර, ගිණුම් හිමියකු විසින්, ඒ ගිණුම් හිමියාගේ යම් ජංගම ගිණුමකට, නිදහස් කරන ලද හර කිරීම් වෙනුවෙන් ඊට පූර්ව ලිත් මාසයේ දී කළ හර කිරීම් පිළිබඳ ප්‍රකාශයක්, කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන ආකෘතියකින්, වාණිජ බැංකුව වෙත සැපයිය යුතු ය :

එසේ වුවද, මාසයේ පහළොස්වන දිනය වැඩ නොකරන දිනයකට යෙදුන හොත්, එම ප්‍රකාශය, ඉන් පසුව එළඹෙන ප්‍රථම වැඩ කරන දිනයේ දී කරනු ලැබිය යුතු ය.

(3) ගිණුම් හිමියකු, (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කාලය ඇතුළත ප්‍රකාශයක් සැපයීමට අපොහොසත් වුවහොත්, එම හර බද්ද ගෙවනු ලැබූ දින සිට මාස දොළහක කාලයක් ඇතුළත ඒ තැනැත්තා විසින් එම ආපසුගෙවීම සඳහා කොමසාරිස් ජනරාල්වරයාගෙන් ඉල්ලීමක් කළ හැකි ය. එසේ වුවද, එම ඉල්ලීම ලියවිල්ලකින් විය යුතු අතර එම ආපසු ගෙවීම, නිදහස් කර තිබෙන හර කිරීමකින් අයකළ හර බද්දක් බවට කොමසාරිස් ජනරාල්වරයාට පිළිගත හැකි සාක්ෂි සපයා තිබිය යුතු ය.

(4) රැස්කිරීමේ ගිණුමක් හෝ විශේෂ ගිණුමක් විවෘත කරනු ලැබූ විට, වාණිජ බැංකුවක් විසින්, ඒ ගිණුම විවෘත කළ ලින් මාසයට පසු මාසයේ වැඩ කරන අවසාන දින හෝ ඊට ප්‍රථම, ඒ ගිණුම් පවත්වාගෙන යනු ලබන්නේ යම් තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ නමින් හෝ නම්වලින් ද ඒ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නම හෝ නම් සහ ලිපිනය කොමසාරිස් ජනරාල්වරයා වෙත වාර්තා කළ යුතු ය. ඒ තැනැත්තා විසින් දෙන ලද ප්‍රකාශයේ සහ පොරොන්දු පත්‍රයේ පිටපතක් ද එවිය යුතු ය.

(5) ජංගම ගිණුමක හර කිරීම් (අ) ඡේදයේ විධිවිධාන සලසා තිබෙන පරිදි මුළුමණින් නිදහස් කර ඇති තැනැත්තකු සම්බන්ධයෙන් හැර, යම් චංචල හෝ නිශ්චල දේපළක් මිල දී ගැනීමේ හෝ යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ පිරිවැය වැනි ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් ඇතුළු වෙනත් වියදම් දැරීම පිණිස (ආ), (ඇ), (ඈ), (ඉ) සහ (ඊ) ඡේද යටතේ නිශ්චිතව සඳහන් වාණිජ බැංකුවක්, විශේෂිත බැංකුවක්, බලයලත් වෙළෙන්දකු, මුදල් සමාගමක්, බලපත්‍රලත් මුල්‍ය කල්බදු සමාගමක්, මුල්‍ය අතරමැදියකු හෝ වෙනත් තැනැත්තකු විසින් කරනු ලබන ගෙවීම්වලට, (ආ), (ඇ), (ඈ) (ඉ) සහ (ඊ) ඡේදවලින් ප්‍රදානය කරන නිදහස් කිරීම් අදාළ නොවන බව, සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :

එසේ වුවද, වාණිජ බැංකු, විශේෂිත බැංකු, බලපත්‍රලත් මුල්‍ය කල්බදු සමාගම් සහ කොමසාරිස් ජනරාල්වරයා විසින් (ඇ) (vii) ඡේදයට අනුකූලව අනුමත කර තිබෙන වෙනත් මුල්‍ය අතරමැදියන් සම්බන්ධයෙන් වන විට, නිදහස් කර තිබෙන මුල්‍ය මැදිහත් වීමේ ක්‍රියාකාරකමක් හා සම්බන්ධ බැරකමක් වෙනුවෙන් කරන පොලී ගෙවීම්, හර බද්දෙන් බැහැර කළ යුතු ය.

මේ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන බවට වග බලා ගැනීමේ බලය.

**14.** (1) මේ පනතේ විධිවිධාන පිළිපදිනු ලබන්නේ ද නැතහොත් පිළිපැද තිබේ ද යන වග දැනගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය වියහැකි වාර වාර්තා සහ තොරතුරු සපයන ලෙස, කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරනු ලැබූ නිලධරයකු විසින්, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, වාණිජ බැංකුවකට, විශේෂිත බැංකුවකට, මුදල් සමාගමකට හෝ බලයලත් වෙළෙන්දකුට නියම කරනු ලැබිය හැකි අතර, එකී බැංකුවේ, මුදල් සමාගම හෝ වෙළෙන්දා විසින් පවත්වාගෙන යන යම් පොත්පත්, වාර්තා හෝ වෙනත් ලේඛන එකී නිලධරයා විසින් පරීක්ෂා කර බලා ඒවායේ සටහන් පිටපත් කරගනු ලැබිය හැකි ය.

(2) වෙනත් යම් නීතියක පටහැනිව කවර විධිවිධානයක් තිබුණ ද, (1) වන උපවගන්තිය යටතේ පනවා තිබෙන නියමයන් සෑම වාණිජ බැංකුවක්, විශේෂිත බැංකුවක්, මුදල් සමාගමක් සහ බලයලත් වෙළෙන්දකු විසින් ම, පිළිපදිනු ලැබිය යුතු අතර, ඒ බැංකුව, මුදල් සමාගම හෝ වෙළෙන්දා විසින් පවත්වාගෙන යනු ලබන යම් පොත්පත්, වාර්තා හෝ වෙනත් ලේඛන පරීක්ෂා කිරීම සඳහා ඒ උපවගන්තියේ සඳහන් නිලධරයාට අවශ්‍ය විය හැකි සියලු පහසුකම්, සැලැස්විය යුතු ය.

(3) මේ පනත යටතේ තමාගේ කාර්ය ඉටු කිරීමෙහි දී හැර, යම් වාණිජ බැංකුවක, විශේෂිත බැංකුවක, මුදල් සමාගමක හෝ බලයලත් වෙළෙන්දකුගේ කටයුතුවලට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන්, මේ වගන්තිය යටතේ ස්වකීය කාර්ය ඉටුකිරීමේ දී දැනගන්නට ලැබෙන සියලු දේ සම්බන්ධව රහස්‍යභාවය ආරක්ෂා කළ යුතු හා ආරක්ෂා කිරීමට සහාය විය යුතු අතර, ඒ කිසි දෙයක් පිළිබඳව භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට, කොමසාරිස් ජනරාල්වරයාට හෝ අධිකරණයකට හැර දැනුම් දීමක් නොකළ යුතු ය.

**15.** (1) යම් වාණිජ බැංකුවක්, විශේෂිත බැංකුවක්, මුදල් සමාගමක් හෝ බලයලත් වෙළෙන්දකු විසින්– වැරදි.

(අ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ කරන ලද යම් නියමයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ පිළිපැදීම පැහැර හරිනු ලැබුවහොත් හෝ උල්ලංඝනය කරනු ලැබුවහොත් ;

(ආ) ඒ වාණිජ බැංකුව, විශේෂිත බැංකුව, මුදල් සමාගම හෝ බලයලත් වෙළෙන්ද විසින් සපයනු ලබන යම් වාර වාර්තාවක හෝ තොරතුරු ප්‍රකාශයක යම් සාවද්‍ය ප්‍රකාශයක් දැනුවත්ව කරන නැතහොත් ඒ යම් වාර්තාවකින් හෝ, තොරතුරු ප්‍රකාශයකින් යම් වැදගත් විස්තරයක් දැනුවත්ව අත්හරින,

අවස්ථාවෝචිත පරිදි, ඒ බැංකුව, මුදල් සමාගම හෝ බලයලත් වෙළෙන්ද, මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස ලක්ෂයක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය :

එසේ වුවද, කොමසාරිස් ජනරාල්වරයා විසින් රුපියල් මිලියන එකක් නොඉක්මවන දණ්ඩනයක් නියම කර ඒ වරද සමථයට පත් කරනු ලැබිය හැකි අතර, එම මුදල ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) වාණිජ බැංකුවක ගිණුමක් දරමින් අසත්‍ය ප්‍රකාශයක පදනම මත "රැස්කිරීමේ" ගිණුමක් හෝ විශේෂ ජංගම ගිණුමක් විවෘත කරන හෝ ජංගම ගිණුම විවෘත කරන වේලාවේ දී දෙන ලද පොරොන්දු කඩවන පරිදි ක්‍රියා කරන යම් තැනැත්තෙක් පනතේ 10 වන වගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කරනු ලැබූ විට රුපියල් මිලියන එකක් නොඉක්මවන මුදලක් සහ ඊට එකතුව, එකී ක්‍රියාව හේතුවෙන් අයකරගනු නොලැබූ හර බද්ද මෙන් දෙගුණයක දණ්ඩන මුදලක් ගෙවීමට යටත් වන්නේ ය.

(3) මේ පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන සෑම තැනැත්තෙක්ම මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ හය මාසයකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ යටත් වන්නේ ය.

නියෝග.

**16.** (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාවට නැංවීමේ කාර්යය සඳහා සහ නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් නියමිත කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, පාර්ලිමේන්තුව වෙත, අනුමතිය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ ඉදිරිපත් කරනු ලැබ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම, ඒ යටතේ ඊට පෙර කරන ලද කිසිවක වලංගු භාවයට හානියක් නොමැතිව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ සේ සලකනු ලැබිය යුතු ය.

(4) ඒ නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

17. මේ පනතේ විධිවිධාන, සියලු කාර්ය සඳහා, 2002 ජූනි මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය. අතීතයට බලපෑම.

18. (1) 2002 ජූනි මස 1 වන දිනෙන් ආරම්භවන දින සිට මේ පනත පාර්ලිමේන්තුවේ පනතක් ලෙස සම්මත වන දිනය අතර කාලසීමාව තුළ, 6 වන වගන්තියේ විධිවිධාන සලසා තිබෙන පරිදි හර බද්ද රැස් කර ප්‍රේෂණය කරන යම් වාණිජ බැංකුවක්, විශේෂිත බැංකුවක්, මුදල් සමාගමක් හෝ බලයලත් වෙළෙන්දකු නිසි බලය ඇතිව ක්‍රියාකර ඇති සේ සැලකිය යුතු අතර එසේ එම බදු එකතු කිරීම සම්බන්ධයෙන් යම් සිවිල් හෝ අපරාධ නඩු පැවරීමකින්, මෙයින් මුක්තිදානය කරනු ලැබේ. වගකීමෙන් ආරක්ෂාව.

(2) යම් තැනැත්තකු විසින් පවත්වාගෙන යන ජංගම ගිණුමකින් හර බදු වශයෙන් හෝ තැන්පතු සහතිකයක් හෝ සංචාරක චෙක්පතක් මුදල් කිරීමෙන් ඒ තැනැත්තා උපලබ්ධ කර ගන්නා මුදල් ප්‍රමාණයෙන් හර බදු වශයෙන්, ඒ තැනැත්තා ගෙවීමට යටත් මුදල් ප්‍රමාණය ඉක්මවා යම් හර බද්දක් අයකර ගන්නා යම් වාණිජ බැංකුවක්, විශේෂිත බැංකුවක්, මුදල් සමාගමක් නැතහොත් බලයලත් වෙළෙන්දෙක් නැතහොත් ඒ තැනැත්තා බැංකුවක පවත්වාගෙන යන ජංගම ගිණුමකින්, 13 වන වගන්තිය මගින් හෝ එය යටතේ හර බද්දෙන් නිදහස් කර තිබෙන යම් හර කිරීමකින් හර බද්ද අයකර ගන්නා යම් වාණිජ බැංකුවක්, අවස්ථාවෝචිත පරිදි, 2002 ජූනි 1 වන දින සිට සහ ඉන් පසුව සහ ඒ මුදල් ප්‍රමාණය ආපසු ගෙවනු ලැබූ හෝ ඒ මුදල් ප්‍රමාණය කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබූ දින සිට සහ ඉන් පසු එසේ මුදල් එක් රැස් කිරීම සම්බන්ධයෙන් යම් සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු ලැබීමෙන් නිදහස් වන්නේ ය.

19. මේ පනතෙහි, පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස - අර්ථ නිරූපණය.

"බැංකු පනත" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත අදහස් වේ ;

"රැස් කිරීමේ ගිණුම" යන්නෙන්, වාණිජ බැංකුවක් විසින් පවත්වාගෙන යන්නා වූ ද අරමුදල් මාරු කිරීමේ පහසුකම් සලසන්නා වූ එහෙත් ඊට අණකර චෙක්පත් ලිවිය නොහැක්කා වූ ද ගිණුමක් අදහස් වේ ;

"වාණිජ බැංකුව" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූල, බලපත්‍රලත් වාණිජ බැංකුවක් අදහස් වේ ;

"කොමසාරිස් ජනරාල්" යන්නෙන්, 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ පත් කරන ලද හෝ පත් කරන ලද සේ සැලකෙන දේශීය අදායම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ ;

"ජංගම ගිණුම්" යන්නෙන්-

(අ) වාණිජ බැංකුවක් විසින් එවැනි යම් බැංකුවක් ද ඇතුළුව යම් තැනැත්තකු හෝ තැනැත්තන් සඳහා පවත්වාගෙන යන (ඉතිරි කිරීමේ ගිණුමක්, අනේවාසික විදේශ මුදල් ගිණුමක්, වාසික විදේශ මුදල් ගිණුමක්, විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයේ ගිණුමක් සහ කොටස් ආයෝජන සහිත බාහිර රුපියල් ගිණුමක් හැර) බැර සහිත හෝ අන්‍යාකාර වූ හා ඒ තැනැත්තා විසින් චෙක්පතක්, අණකරයක්, ඇණවුමක් හෝ වෙනත් උපදේශයක් මගින් ගෙවීම් ලබාගත හැකි ගිණුමක් ; සහ

(ආ) වාණිජ බැංකුවක පවත්වාගෙන යන, ඒ බැංකුවේ-

(i) යම් වංචල හෝ නිශ්චල දේපළක් මිල දී ගැනීමේ හෝ යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ පිරිවැය වැනි ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් ; සහ

(ii) ගෙවීමක් ඇතුළත් වන්නා වූ සහ ඒ වෙනුවෙන් අභ්‍යන්තර හෝ බාහිර වශයෙන් ඒ සඳහා හර කිරීම් සිදු කරනු ලබන්නා වූ සියලු ව්‍යාපාරික වියදම්,

ඇතුළු යම් වියදම් දැරීම පිණිස ගෙවීම් කරනු ලබන, අභ්‍යන්තර ගිණුමක් අදහස් වේ ;

"හර" යන්නෙන්, යම් තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ ජංගම ගිණුමකින්, චෙක් පතක්, අණකරයක්, ඇණවුමක්, හෝ වෙනත් උපදේශයක් මගින් කරන මුදල් අස්කර ගැනීමක් සම්බන්ධයෙන්, ඒ ජංගම ගිණුමෙහි කරන සටහනක් අදහස් වන අතර, ඊට වාණිජ බැංකුවක් විසින් ඒ බැංකුවේ පවත්වාගෙන යන ජංගම ගිණුමක එහි ව්‍යාපාරික ක්‍රියාමාර්ගවල දී කරන අයහාරයක් ඇතුළත් වේ ;

"සේවක අර්ථසාධක අරමුදල" යන්නෙන්, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනත මගින් පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදල අදහස් වේ ;

"සේවා නියුක්තයන්ගේ භාර අරමුදල" යන්නෙන්, 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල පනත මගින් පිහිටුවන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල අදහස් වේ ;

"මුදල් සමාගම" යන්නෙන්, මූල්‍ය ව්‍යාපාර කරගෙන යාම සඳහා 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් අදහස් වේ.

"විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ගිණුම" යන්නෙන්, වාණිජ බැංකුවක පවත්වාගෙන යන්නා වූ ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එසේ නම් කර ඇත්තා වූ ද, ගිණුමක් අදහස් වේ.

"බලපත්‍රලත් මූල්‍ය කල්බදු සමාගම" යන්නෙන්, 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත යටතේ බලපත්‍රලත් සමාගමක් අදහස් වේ ;

"බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරු" යන්නෙන්, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු අදහස් වේ ;

"බලපත්‍රලත් නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරු" යන්නෙන්, 1979 අංක 9 දරන නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන්ට බලපත්‍ර දීමේ පනත යටතේ බලපත්‍ර ලත් නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවකු අදහස් වේ ;

"අනේවාසික විදේශීය ව්‍යවහාර මුදල් ගිණුම" යන්නෙන්, වාණිජ බැංකුවක පවත්වාගෙන යන්නා වූ ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එසේ නම් කර ඇත්තා වූ ද ගිණුමක් අදහස් වේ ;

"පාරිතෝෂික ගෙවීමේ පනත" යන්නෙන් ; 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත අදහස් වේ ;

"නේවාසික විදේශීය ව්‍යවහාර මුදල් ගිණුම" යන්නෙන්, වාණිජ බැංකුවක පවත්වාගෙන යන්නා වූ ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එසේ නම් කර ඇත්තා වූ ද ගිණුමක් අදහස් වේ ;

"ඉතිරිකිරීමේ ගිණුම" යන්නෙන්, වාණිජ බැංකුවක පවත්වාගෙන යන්නා වූ ද එහි තැන්පත් කරන අරමුදල් සඳහා පොලියක් උපයාගන්නා වූ ද, ඒ ගිණුමකින් මුදල් ආපසු ලබා ගැනීම යම් නිශ්චිත කාලසීමාවකට වරක් හෝ බැංකුව විසින් නිශ්චිතව නියම කරනු ලබන රීතිවලට යටත්ව හෝ සිදු කරනු ලැබිය හැකි ගිණුමක් අදහස් වේ ;

"විශේෂිත බැංකුව" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූල බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**20.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.